# Have You Heard of the Four Spiritual Laws?

*Just as there are physical laws that govern the physical universe, so are there spiritual laws which govern your relationship with God.*

## 1 LAW ONE

GOD **LOVES** YOU AND OFFERS A WONDERFUL **PLAN** FOR YOUR LIFE.

*(References contained in this booklet should be read in context from the Bible whenever possible)*

**GOD'S LOVE**

*"For God so loved the world that He gave His one and only Son, that whoever believes in Him shall not perish, but have eternal life". (John 3:16 NIV)*

**GOD'S PLAN**

[Christ speaking] *"I came that they might have life, and might have it abundantly"* [that it might be full and meaningful]*. (John 10:10)*

*Why is it that most people are not experiencing a full and meaningful life?*
*Because…*

# ඔබ අධ්‍යාත්මික ප්‍රතිපත්ති හතර ගැන අසා ඇද්ද?

*මේ ලෝකය පාලනය කිරීමට ස්වාභාවික ප්‍රතිපත්ති තිබෙන්නාක් මෙන් දෙවියන්වහන්සේ හා ඔබ අතර සම්බන්ධතාවය පාලනය කිරීමට අධ්‍යාත්මික ප්‍රතිපත්ති තිබේ.*

## 1 පළමුවැනි ප්‍රතිපත්තිය:

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක. උන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා අනගි සැලැස්මක් පිළියෙල කර තිබේ.

*(මෙහි සඳහන් ශුද්ධ ලියවිලි පද හැකි පමණ බයිබලයෙන් කියවන්න).*

**දෙවියන් වහන්සේගේ ප්‍රේමය:**

"මක්නිසාදයත් දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සැම දෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3:16).

**දෙවියන්වහන්සේගේ සැලැස්ම:**

යේසුස්වහන්සේ මෙසේ කියයි: "මා ආවේ ඔවුනට ජීවනය ලැබෙන පිණිසත්, එය අධික ලෙස ලැබෙන පිණිසත්ය" (සම්පූර්ණ සඵලවත් ජීවිතයක්) (යොහන් 10:10).

*බොහෝ දෙනකුන් මෙවැනි සම්පූර්ණ සඵලවත් ජීවිතයක් අත් දකින්නේ නැත්තේ ඇයි? හේතුව මෙයයි...*

## 2 LAW TWO

**MAN IS SINFUL AND SEPARATED FROM GOD. THUS, HE CANNOT KNOW AND EXPERIENCE GOD'S LOVE AND PLAN FOR HIS LIFE.**

### MAN IS SINFUL

*"For all have sinned and fall short of the glory of God." (Romans 3:23)*

Man was created to have fellowship with God; but, because of his stubborn self-will, he chose to go his own independent way, and fellowship with God was broken. This self-will, characterized by an attitude of active rebellion or passive indifference, is an evidence of what the Bible calls sin.

### MAN IS SEPARATED

*"For the wages of sin is death"* [spiritual separation from God]. (Romans 6:23)




This diagram illustrates that God is holy but man is sinful. Therefore a great gulf separates the two. The arrows illustrate that man is continually trying to reach God and the abundant life through his own efforts, such as a good life, philosophy, or religion - but he inevitably fails.

*The third law provides the only solution to this problem...*

## 2 දෙවෙනි ප්‍රතිපත්තිය:

**මිනිසා පාපිෂ්ඨව දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටී. එම නිසා දේව ප්‍රේමය අත්දැකීමටත් තම ජීවිතය සඳහා දේව සැලැස්ම තේරුම් ගැනීමටත් ඔහුට නොහැකිය.**

### මිනිසා පාපිෂ්ඨය:

"මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති" (රෝම 3:23).

මිනිසා දේව සහභාගිකම දරණ පිණිස මවන ලදි. එහෙත් හෙතෙම තමාගේම කැමැත්ත කරමින් මුරණ්ඩු ලෙස නිද හස්ව සිටීමට තීරණය කළේය. ඒ හේතුකොටගෙන දේව සහභාගිකම බිඳුණේය. බයිබලය අනුව "පාපය" නම් දෙවියන්වහන්සේව නොසැලකීමේ ස්වභාවයකි. එය තම කැමැත්ත අනුව ක්‍රියාවෙන් විරුද්ධත්වය දක්වීමෙන් හෝ අදහසින් නොසැලකිළිවන්තකම පෙන්වීමෙන් හෝ දක්විය හැකිය.

### මිනිසා දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටී.

"මක්නිසාද පාපයේ කුලිය නම් මරණයයි" (දෙවියන් වහන්සේගෙන් අධ්‍යාත්මික ලෙස වෙන්වීම) (රෝම 6:23).




මෙම සටහනේ පෙන්වන පරිදි දෙවියන්වහන්සේ ශුද්ධය එහෙත් මිනිසා පව්කාරය. එම නිසා මේ දෙදෙනා අතර ඇත්තේම හත් පරතරයකි. මෙහි ඊතලවලින් පෙන්වන්නේ මිනිසා තමාගේම උත්සාහයෙන්, එනම් යහපත් ජීවිතයකින් හෝ සුචරිතයෙන් හෝ දර්ශනවාදයෙන් හෝ දෙවියන්වහන්සේ වෙතට පැමිණ, අධික ජීවනය ලබන්ට නොකඩවා වීරිය කිරීමයි - එහෙත් අවසානයේ එය අසාර්ථකය.

*තුන්වැනි ප්‍රතිපත්තිය මෙම ගැටළුවට ඇති එකම පිළිතුර සපයයි.*

3

## LAW THREE

JESUS CHRIST IS GOD'S **ONLY** PROVISION FOR MAN'S SIN. THROUGH HIM YOU CAN KNOW AND EXPERIENCE GOD'S LOVE AND PLAN FOR YOUR LIFE.

### HE DIED IN OUR PLACE

*"God demonstrates His own love toward us, in that while we were yet sinners, Christ died for us." (Romans 5:8)*

### HE ROSE FROM THE DEAD

*"Christ died for our sins...He was buried...He was raised on the third day, according to the Scriptures...He appeared to Peter, then to the twelve. After that He appeared to more than five hundred…." (1 Corinthians 15:3-6)*

### HE IS THE ONLY WAY TO GOD

*"Jesus said to him, 'I am the way, and the truth, and the life; no one comes to the Father, but through Me'." (John 14:6)*




This diagram illustrates that God has bridged the gulf which separates us from Him by sending His Son, Jesus Christ, to die on the cross in our place to pay the penalty for our sins.

*It is not enough just to know these three laws…*

3

## තුන්වැනි ප්‍රතිපත්තිය:

මිනිසාගේ පාපයට දෙවියන්වහන්සේගේ එකම ප්‍රතිකාරය යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. උන්වහන්සේ තුලින් ඔබට දේව ප්‍රේමයද, ඔබගේ ජීවිතය සඳහා දේව සැලැස්මද තේරුම් ගැනීමටත් අත්දැකීම ටත් හැකිය.

### යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් මැරුණු සේක:

"දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවෙන් ක්‍රිස්තුස්වහන්සේට මරණය විඳීමට සැලැස්වීමෙන්ය" (රෝම 5:8).

### යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් උත්ථානවූසේක:

අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත්, තුන්වැනිද උන්වහන්සේ උත්ථානවූ බවත්, පේදුරුටද, පසුව දෙළොස් දෙනාටද, ඉන්පසු එකවිටම පන්සියකට වඩා වැඩි පිරිසකටද පෙනුණ බවත් බයිබලයේ සඳහන්වේ (1 කොරින්ති 15:3-6).

### දෙවියන්වහන්සේ වෙතට එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

යේසුස්වහන්සේ ඔහුට මෙසේ කීවේය: "මාර්ගයද, සත්‍යයද, ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත" (යොහන් 14:6)

.




.

මෙම සටහනේ දක්වෙන පරිදි, දෙවියන්වහන්සේ හා මිනිසා අතර ඇති මහත් පරතරය ඉවත්කරන පිණිස උන්වහන්සේ තම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, අපගේ පාපයට වන්දි ගෙවන්නට, අප උදෙසා කුරුසිය පිට මැරෙන්නට එවූසේක.

*මෙම ප්‍රතිපත්ති තුන දැනගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ...*

# 4

## LAW FOUR

WE MUST INDIVIDUALLY **RECEIVE** JESUS CHRIST AS SAVIOUR AND LORD; THEN WE CAN KNOW AND EXPERIENCE GOD'S LOVE AND PLAN FOR OUR LIVES.

### WE MUST RECEIVE CHRIST

*"As many as received Him, to them He gave the right to become children of God, even to those who believe in His name." (John 1:12)*

### WE RECEIVE CHRIST THROUGH FAITH

*"For it is by grace you have been saved through faith; and that not of yourselves, it is the gift of God; not as a result of works, that no one should boast." (Ephesians 2:8,9)*

# 4

## හතරවැනි ප්‍රතිපත්තිය:

යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අපගේ ගැළවුම්කාරයාණන් හා ස්වාමින්වහන්සේ හැටියට පෞද්ගලික ආරාධනයෙන් අප **පිළිගත** යුතුය. එවිට දේව ප්‍රේමය හා අප ජීවිතය සඳහා දේව සැලැස්ම තේරුම් ගැනීමටත් අත්දැකීමටත් අපට පුළුවන.

### අප ක්‍රිස්තුස්වහන්සේ පිළිගත යුතුය:

"යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන් වහන්සේගේ දරුවන් වෙන්ට වරම උන්වහන්සේ දුන්සේක" (යොහන් 1:12).

### අප ක්‍රිස්තුස් වහන්සේ පිළිගන්නේ ඇදහිල්ලෙන්ය:

"මක්නිසාද ඔබ ගැලවී සිටින්නේ දේව වරප්‍රසාදය මගින් වූ ඇදහීම කරණකොටගෙනය. එය ඔබගේම ක්‍රියාවක් නොව, දෙවියන්වහන්සේගේ දීමනාවකි. ගැලවීම පුණ්‍ය ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන බැවින් කිසිවකුට පාරට්ටුවට ඉඩක් නැත" (එපීස 2:8-9).

### WE RECEIVE CHRIST BY PERSONAL INVITATION

[Christ speaking] *"Here I am! I stand at the door and knock. If anyone hears my voice and opens the door, I will come in and eat with him." (Revelation 3:20)*

Receiving Christ involves turning to God from self (repentance) and trusting Christ to come into our lives to forgive our sins and to make us what He wants us to be. Just to agree intellectually with His laws is not enough. Nor is it enough to have an emotional experience.

### අපි පෞද්ගලික ආරාධනයෙන් ක්‍රිස්තුස් වහන්සේ පිළිගන්නෙමු:

ක්‍රිස්තුස් වහන්සේ මෙසේ කියයි: "මෙන්න මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්, මම ඇතුලටවිත් ඔහු සමග කෑම කන්නෙමි" (එළිදරව් 3:20).

ක්‍රිස්තුස් වහන්සේ පිළිගැනීම නම්, තම ජීවිතය මමත්වයේ පාලනයෙන් දෙවියන් වහන්සේගේ පාලනයට භාර කිරීමත්, අපගේ ජීවිත තුලට පැමිණ, අප පාපයන්ට සමාව දීමට හා දේව සැලැස්ම අනුව අප හැඩ ගැස්වීමට ක්‍රිස්තුස් වහන්සේ තුල විශ්වාසය තැබීමත්ය. උන්වහන්සේගේ ප්‍රතිපත්තිවලට බුද්ධිමත් ලෙස එකඟවීමක් හෝ හැඟීම් කරණකොටගෙන ලබන අත්දැකීමක් හෝ මේ සඳහා නොසෑහේ.

**These two circles represent two kinds of lives:**




**S** – Self is on the throne.
**†** – Christ is outside the life.
• – Interests are directed by self, often resulting in discord and frustration.




**†** – Christ is in the life and on the throne.
**S** – Self is yielding to Christ.
• – Interests are directed by Christ, resulting in harmony with God's plan.

**Which circle best describes your life?**

**Which circle would you like to have represent your life?**

*The following explains how you can receive Christ:*

**මෙම සටහන් දෙක ජීවිත වර්ග දෙකක් නිරූපණය කරයි.**




**ම** – මමත්වය ජීවිතය පාලනය කරයි.
**†** – ක්‍රිස්තුස් වහන්සේ ජීවිතයෙන් පිටතය.
• – මමත්වය ආශාවන් පාලනය කරන නිසා නිතරම අවුල්සහගත ස්වභාවයක් හා නිශ්ඵල බවක් හටග නී.




**†** – ක්‍රිස්තුස් වහන්සේ ජීවිතය පාලනය කරයි.
**ම** – මමත්වය ක්‍රිස්තුස් වහන්සේට ඉඩ දෙයි.
• – දෙවියන්වහන්සේගේ සැලැස්මට අනුකූලවන පරිදි ක්‍රිස්තුස්වහන්සේ විසින් ආශාවන් පාලනය කරනු ලැබේ.

***ඔබේ ජීවිතය නිරූපණය වන්නේ කුමන සටහනෙන්ද?***

***ඔබේ ජීවිතය හැඩගස්වා ගැනීමට කැමති කොයි සටහන අනුවද?***

*ඔබට ක්‍රිස්තුස් වහන්සේ පිළිගත හැකි ආකාරය පහත දැක්වේ.*

## YOU CAN RECEIVE CHRIST RIGHT NOW BY FAITH THROUGH PRAYER

*(Prayer is talking to God)*

God knows your heart and is not so concerned with your words as He is with the attitude of your heart. The following is a suggested prayer:

**"Lord Jesus, I accept You. I open the door of my life and receive You as my Saviour and Lord. Thank You for forgiving my sins and giving me eternal life. Take control of my life and make me the kind of person You want me to be".**

Does this prayer express the desire of your heart?

If it does, I invite you to pray this prayer right now, and Christ will come into your life, as He promised.

## ඔබගේ ඇදහිල්ල කරණකොටගෙන, ඔබට මේ මොහොතේම යාච්ඤා කර ක්‍රිස්තුස් වහන්සේව පිළිගත හැකිය:

*(යාච්ඤාව නම් දෙවියන් වහන්සේ සමග කථා කිරීමයි).*

දෙවියන්වහන්සේ ඔබගේ සිත දන්නා අතර උන්වහන්සේ වැදගත් කොට සලකන්නේ ඔබගේ වචනය හෝ භාෂාව නොව, ඔබගේ හදවතේ ආකල්පයය. මෙවැනි යාච්ඤාවක් සැහේ:

**"ස්වාමිවූ යේසුස්වහන්ස, මම ඔබවහන්සේ පිළිගනිමි. මාගේ ජීවිතයේ දොර හැර ඔබවහන්සේව මාගේ ස්වාමින් වහන්සේ හා ගැළවුම් කාරයාණන් හැටියට පිළිගනිමි. මාගේ පාපයන්ට සමාව දුන් නිසා හා මට සදාකාලික ජීවිතය ලබා දුන් නිසා ඔබ වහන්සේට ස්තුතිවන්ත වෙමි. මාගේ ජීවිතයේ පාලනය භාරගෙන ඔබගේ සැලැස්ම අනුව මා හැඩගැස්සුව මැනව".**

ඔබේ හදවතේ ඇති කැමැත්ත මෙම යාච්ඤාවෙන් ප්‍රකාශ වන්නේද?

එසේ නම් මේ මොහොතේම මෙම යාච්ඤාව යාච්ඤා කරන්න. එවිට ක්‍රිස්තුස් වහන්සේ, පොරොන්දුවී ඇති පරිදි ඔබ තුළට පැමිණෙනවා ඇත.

## HOW TO KNOW THAT CHRIST IS IN YOUR LIFE

Did you receive Christ into your life? According to His promise in Revelation 3:20, where is Christ right now in relation to you? Christ said that He would come into your life. Would He mislead you? On what authority do you know that God has answered your prayer? (The trustworthiness of God Himself and His Word.)

## ක්‍රිස්තුස් වහන්සේ ඔබගේ ජීවිතය තුල සිටින බව දැන ගන්නේ කෙසේද?

ඔබ ක්‍රිස්තුස් වහන්සේව ඔබගේ ජීවිතය තුලට පිළිගත්තේද? එළිදරව් 3:20 සඳහන් පොරොන්දුව අනුව ඔබට හැඟෙන පරිදි මේ මොහොතේදී උන්වහන්සේ කොහේද? උන්වහන්සේ ඔබගේ ජීවිතය තුලට එන බව කීසේක. උන්වහන්සේ ඔබ නොමග යවයිද? දෙවියන්වහන්සේ ඔබගේ යාච්ඤාවට පිළිතුරු දුන් බව ස්ථිරව දැනගන්නේ කෙසේද? (දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම හා උන්වහන්සේගේ වචනයේ සත්‍යතාවය නිසාමය).

## THE BIBLE PROMISES ETERNAL LIFE TO ALL WHO RECEIVE CHRIST

*"The witness is this, that God has given us eternal life, and this life is in His Son. He who has the Son has the life; he who does not have the Son of God does not have life. These things I have written to you who believe in the name of the Son of God, in order that you may know that you have eternal life." (1 John 5:11-13)*

Thank God often that Christ is in your life and that He will never leave you (Hebrews 13:5). You can know on the basis of His promise that Christ lives in you and that you have eternal life from the very moment you invite Him in. He will not deceive you.

*An important reminder…*

## ක්‍රිස්තුස් වහන්සේ පිළිගත්තාවූ සැමටම සදකාලික ජීවනය ලැබෙන බව බයිබලයේ සඳහන්වේ:

"ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට සදකාල ජීවනය දුන් බව හා ඒ ජීවනය තම පුත්‍රයාණන් තුල ඇති බවද වේ. පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත. දෙවියන් වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහන්නාවූ තුඹලාට මේ දේ මා ලියා එවුවේ තුඹලාට සදකාලික ජීවනය ඇති බව තුඹලා දැනගන්නා පිණිසය" (1 යොහන් 5:11-13).

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුල සිටින නිසාත් උන්වහන්සේ කිසිදක, කිසිවිටෙක ඔබගෙන් අහක්ව නොයන බවට පොරොන්දු වී ඇති නිසාත් (හෙබ්‍රෙව් 13:5 ) දෙවියන් වහන්සේට නිතරම ස්තුති කරන්න. දේව පොරොන්දුව අනුව, ඔබ ක්‍රිස්තුස් වහන්සේ පිළිගත් මොහොතේ සිට, ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුල වාසය කර ඔබට සදකාලික ජීවනය දනය කරනවා ඇත. එතුමා ඔබව රවටන්නේ නැත.

*මතක බා ගත යුතු වැදගත් කරුණක්...*

## DO NOT DEPEND ON FEELINGS

The promise of God's Word, the Bible - not our feelings - is our authority. The Christian lives by faith (trust) in the trustworthiness of God Himself and His Word. This train diagram illustrates the relationship among fact (God and His Word), faith (our trust in God and His Word), and feeling (the result of our faith and obedience). (John 14:21).




The train will run with or without a caboose. However, it would be useless to attempt to pull the train by the caboose. In the same way, as Christians we do not depend on feelings or emotions, but we place our faith (trust) in the trustworthiness of God and the promises of His Word.

## හැඟීම් මත නොයැපෙන්න:

අපට ඇති එකම සහතිකය දේව වචනයේ පොරොන්දුව මිස, අප තුල ඇතිවන හැඟීම් නොවේ. ක්‍රිස්තු භක්තිකයා දෙවියන්වහන්සේගේ හා දේව වචනයේ සත්‍යතාවය කෙරෙහි ඇති විශ්වාසයෙන් ජීවත්වන්නෙකි. මෙම පහත පෙනෙන චිත්‍රය, "සත්‍යය" (දෙවියන්වහන්සේ හා දේව වචනය) "ඇදහිල්ල" (දෙවියන් වහන්සේ හා දේව වචනය කෙරෙහි අපේ විශ්වාසය) සහ "හැඟීම්" (මෙම ඇදහිල්ල හා කීකරුකම කරණකොට ගෙන හටගන්නා ප්‍රතිඵලය) අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරයි (යොහන් 14:21 කියවන්න).




දුම්රිය, මුරකරු මැදිරිය ඇතිව හෝ නැතිව ගමන් කරයි. එහෙත් මුරකරු මැදිරිය ලවා දුම්රිය අද්දවන්නට වෑයම් කිරීම මෝඩ කමකි. එමෙන්ම අප ක්‍රිස්තු භක්තිකයන් වශයෙන් අපේ හැඟීම් මත නොයැපී දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම හා දේව වචනයේ පොරොන්දුව මත අපේ ඇදහිල්ල රැඳවිය යුතුය.

## NOW THAT YOU HAVE RECEIVED CHRIST

The moment that you received Christ by faith, as an act of the will, many things happened, including the following:

1. Christ came into your life. (Revelation 3:20; Colossians 1:27)
2. Your sins were forgiven. (Colossians 2:13, 1:14)
3. You became a child of God. (John 1:12)
4. You began the great adventure for which God created you. (John 10:10, 2 Corinthians 5:17, 1 Thessalonians 5:18)

Can you think of anything more wonderful that could happen to you than receiving Christ? Would you like to thank God in prayer right now for what He has done for you? By thanking God, you demonstrate your faith.

*What should you do now?*

## දැන් ඔබ ක්‍රිස්තුස් වහන්සේ පිළිගෙන ඇති නිසා:

ඇදහිල්ලේ ක්‍රියාවක් වශයෙන් ඔබ ක්‍රිස්තුස් වහන්සේ පිළිගත් මොහොතේදී ඔබට සිදුවූ දේ බොහෝය. ඉන් සමහරක් නම්:

1. ඔබේ ජීවිතය තුළට ක්‍රිස්තුස් වහන්සේ පැමිණි සේක (එළිදරව් 3:20, කොළොස්සි 1:27).
2. ඔබේ පාපවලට සමාව ලැබුණේය (කොළොස්සි 1:14).
3. ඔබ දෙවියන් වහන්සේගේ දරුවෙක් විය (යොහන් 1:12).
4. දෙවියන් වහන්සේ ඔබ වෙනුවෙන් සලසා ඇති අනගි ජීවිතය ඔබ තුළ ආරම්භ විය (යොහන් 10:10; 2 කොරින්ති 5:17; 1 තෙසලෝනි 5:18).

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිගන්නවාට වඩා අනගි ක්‍රියාවක් ගැන ඔබට කල්පනා කළ හැකිද? දෙවියන්වහන්සේ ඔබට කළ මේ මහඟු ක්‍රියාව ගැන මේ මොහොතේම උන්වහන්සේට ස්තුතිවන්තව යාච්ඤා කරන්නට කැමතිද? මෙසේ ස්තුති කිරීමෙන් ඔබේ ඇදහිල්ල ප්‍රකාශ වන්නේය.

*දැන් කුමක් කළ යුතුද?...*

## SUGGESTIONS FOR CHRISTIAN GROWTH

Spiritual growth results from trusting Jesus Christ. “The righteous man shall live by faith” (Galatians 3:11). A life of faith will enable you to trust God increasingly with every detail of your life, and to practice the following:

**G**o to God in prayer daily. (John 15:7)

**R**ead God’s Word daily (Acts 17:11); begin with the Gospel of John.

**O**bey God moment by moment. (John 14:21)

**W**itness for Christ by your life and words. (Matthew 4:19; John 15:8)

**T**rust God for every detail of your life. (1 Peter 5:7)

Allow the **H**oly Spirit to control and empower your daily life and witness. (Galatians 5:16,17; Acts 1:8)

## ක්‍රිස්තියානි ජීවිතය වර්ධනය කරගැනීමට උපදෙස්:

අධ්‍යාත්මික වර්ධනය ක්‍රිස්තුස් වහන්සේ තුළ විශ්වාසය තැබීමෙන් සිදුවේ. ”ධර්මිෂ්ඨයා ඇදහිල්ල කරණකොටගෙන ජීවත්වන්නේය” (ගලාති 3:11). ඇදහිල්ලෙන් ක්‍රියා කරන තැනැත්තාට වැඩි වැඩියෙන් තම ජීවිතයේ සියළු අංශයක්ම විශ්වාසයෙන් දෙවියන්වහන්සේට භාර දෙන්නටත්, පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කරන්නටත් හැකිවෙයි.

- දිනපතා දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම (යොහන් 15:7).
- දිනපතා දේව වචනය කියවීම (ක්‍රියා 17:11) - යොහන්ගේ
- ශුභාරංචියෙන් පටන්ගන්න.
- මොහතක් මොහොතක් පාසා දෙවියන්වහන්සේට කීක රුවීම (යොහන් 14:21).
- ඔබගේ ජීවිතයෙන් හා වචනයෙන් ක්‍රිස්තුස් වහන්සේ ගැන සාක්ෂි දරීම (මතෙව් 4:19; යොහන් 15:8).
- ඔබගේ ජීවිතයේ සියළුම අංශයන් ගැන දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම (1 පේදුරු 5:7).
- ඔබගේ දිනපතා ජීවිතය පාලනය කිරීමටත් ඒ තුලින් සා ක්ෂි දරීමටත් ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩදීම (ගලාති 5:16-17; ක්‍රියා 1:8).

## FELLOWSHIP IN A GOOD CHURCH

God's Word instructs us not to forsake "the assembling of ourselves together" (Hebrews 10:25). Several logs burn brightly together; but put one aside on the cold hearth and the fire goes out. So it is with your relationship with other Christians. If you do not belong to a church, do not wait to be invited. Take the initiative; call the pastor of a nearby church where Christ is honored and His Word is preached. Start this week, and make plans to attend regularly.

If this article has been helpful to you, please give it or read it to someone else. This way you might help another person come to know God personally.

## දේව දරුවන් සමග සහභාගිවීමේ අවශ්‍යතාවය:

අප සාමූහිකව එකට එක්වී පවත්වන සහභාගිත්වය අත් නොහළ යුතුයයි දේව වචනය (හෙබ්‍රෙව් 10:25) අපට අවවාද කරයි. ගිනිගොඩක ලී කොට එකට තිබෙන විට, හොඳින් ගිනි ඇවිලේ. නමුත් ඉන් එක් කොටයක් ඉවත් කළහොත් එය නිවී යන්නේය. අනෙක් ක්‍රිස්තු භක්තිකයන් සමග සම්බන්ධකම් පැවැත්වීමත් එසේමය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ගෞරව යෙන් යුතුව දේව වචනය හොඳ හැටි දේශනා කරන දේවස් ඨානයක් ප්‍රමාද නොවී තෝරා ගෙන එහි දේව මෙහෙයන්ට නිරන්තරයෙන් සහභාගිවන්න.

## WANT FURTHER HELP?

If you would like help in developing a closer relationship with Jesus Christ, please visit:

- www.hereslife.com/connect
- www.ichristianlife.com
- www.looktojesus.com
- www.growinginchrist.com
- www.basicsteps.org
- www.greatcom.org

මේ පොත් පිංච ඔබට උපකාරවුනි නම් වෙන කෙනෙකුටද මෙය දෙන්න, නැත්නම් කියවා දෙන්න.

ඒ ගැන තව දුරටත් ඉගෙන ගැනීමට හා සාකච්ඡා කිරීමට කැමති නම් අප අමතන්න.

කැම්පස් කෲසේඩ් ආයතනය.
තැ. පෙ. 480 කොළඹ.

දුරකථනය: 011-2854-042
ෆැක්ස්: 011-2854-042

ඊ-මේල්: oswaldcc@sltnet.lk
වෙබ් අඩවිය: www.hereslife.com

We encourage the use of this material. However, in order to maintain quality and protect the content from changes, neither this booklet nor parts thereof may be reproduced in any form without written permission from Campus Crusade for Christ, PO Box 565, Mulgrave, VIC 3170

© 1985- 2008 Campus Crusade for Christ Australia A.C.N 002 310 796

Item: SinEng4pWBwf610

**This booklet is also available in many other languages from www.hereslife.com/tracts**